# හොඳ පුරුදු



කතාව සහ චිත්‍ර

චනුලි දිනායා කරුණාරත්න

# හොඳ පුරුදු

චනුලි දිනායා කරුණාරත්න

# හොඳ පුරුදු

**කතෘ**

චනුලි දිනායා කරුණාරත්න

**කතෘගේ ප්‍රථම කෘතිය**

| | | |
|---|---|---|
| පාසල | : | මහාමායා බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පංතිය | : | 3 - A |
| කෘතිය පළකරන දිනය | : | 2026 මැයි 10 |
| ISBN | : | 978 - 624- 208- 997-3 |

# පිදුම

මාගේ අම්මා සහ අප්පච්චි ට ද,

ගුරු මෑණිවරුන්ට ද

ආදරයෙන්

මෙම පොත පිළිගන්වමි.



# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළඳා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂත, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයක් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක වන ලේඛිකාවක් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබාදීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක ගමක තාරක කියලා ළමයෙක් ජීවත් වුණා. ඔහු ඉගෙනුම ලැබුවේ පහ ශ්‍රේණියේය. තාරක පාසලට යන්නේ හැමදාම පයින් ඒ පාසල ළඟ නිසා.



ඔහු පාසල් යන පාරේ ගෙඩි පිරුණු අඹ ගසක් තිබුණා.

තාරක උඩ බැලුවා. ඉදුණු අඹ පිරිලා තිබුණා.

කොහොම හරි අඹ කන  අදහසෙන් ඉක්මන් ගමනින්

පාසල වෙත ගියා.



පාසලේ වැඩ කටයුතු කරන අතරත් මතක් වුණේම

ඉදුණු ගෙඩි පිරුණු අඹ ගසයි.



පාසල නිම වන සීනුවේ හඬ තාරකට ඇසුණා.

පොත් බෑගය ගත් ඔහු ඉක්මනින් පාසලෙන් පිටවුණා.

ඔහු අඹ ගහ ළඟට දුවගෙන ආවා.

“මෙන්න ලොකු ඉදුණු අඹ ගෙඩියක්” බිම වැටී තිබූ ඉදුණු ලොකු අඹ ගෙඩිය අහුලාගත් තාරක එය කාගෙන කාගෙන ගියා.

“හරිම රසයි” කියමින් තාරක සතුටින් ගෙදර ගියා.



හැමදාම වගේ අම්මා මිදුලට වී ඔහු එනතුරු බලන් ඉන්නවා තාරක දුටුවා.

“ඇයි අද ප්‍රමාද” අම්මා ඇසුවා.

“මම ප්‍රමාද ද අම්මා” තාරක අම්මාගෙන් ඇහුවා.



“පුතා ඇඟ සෝදා කෑම කන්න” අම්මා කිව්වා.
තාරක ඇවිත් කෑම එක ගත්තා.

කෑම එක අතට ගත්තත් කන්න පිරියක් නෑ වගේ තාරක හිතුවා. “ඇයි  කෑම එක අතගාන්නේ මොනවා හරි කාලා ආවද?” අම්මා ඇසුවා.

“නෑ අම්මා” තාරක හිමින් පිළිතුරු දුන්නා.



ටික  වේලාවක් ගත වුණා. තාරකගේ බඩ ටික ටික රිදෙන්න පටන් ගත්තා.

එන්න එන්නම බඩේ අමාරුව වැඩියි.

තාරකට කතා කරගන්නවත් බෑ වගේ.

“පුතා, පුතා ඇයි මේ මම හැමතැනම හෙව්වා”

අම්මා කිව්වා.

“අම්මා මගේ බඩ රිදෙනවා” තාරක අමාරුවෙන්

කිව්වා..

අම්මා බෙහෙත් සාදා දුන්නා. නමුත් බඩේ අමාරුව වැඩි වී වමනය යන්න පටන් ගත්තා.



අම්මා විසින් තාරක වෛද්‍යවරයා වෙත රැගෙන ගියා.

වෛද්‍යවරයා විසින් විස්තර විමසා බලා කෑමට ගත් දේවල් පිළිබඳ විමසා හිටියා. තාරක අඹ කෑ විස්තරය පැවසුවා.

අමුවෙන් ආහාරයට ගන්නා සියලුම දේවල්, බිම වැටී තිබී අහුලාගෙන ආහාරයට ගන්නා දේවල් පිරිසිදු ජලයෙන් හොඳින් සෝදා ආහාරයට ගත්තේ නැත්නම් ඒවායේ තිබෙන විසබීජ අපේ ඇඟට ඇතුළු වී ලෙඩ කරන ආකාරය වෛද්‍යවරයා පැහැදිලි කළා.

තාරකට බෙහෙත් දෙන ගමන්, ආයේ කවදාවත් බිම වැටී තිබුණු දේවල් සෝදා ආහාරයට ගත යුතු බව අම්මා කිව්වා.

කෑමට පෙර අත් සබන් දා සෝදා පිරිසිදු කිරීම හොඳ පුරුද්දක් බවද තාරකගේ ඔළුව අතගාමින් අම්මා කිව්වා.

තාරක ඔළුව වනමින් හිනාවුණා.

නිමි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දායට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරවකට අනාගත ලෝකයේ පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පෙතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයතක් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්තවෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)